මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය

**පුනරුත්ථාපන කාර්යාංශය**

# පුරප්පාඩු

## <u>පුනරුත්ථාපන කාර්යාංශයේ සහ ඒ යටතේ ස්ථාපිත පුනරුත්ථාපන මධ්‍යස්ථානයන්හි පහත සඳහන් වෘත්තීන්ට අදාලව පවතින පුරප්පාඩු සඳහා සුදුසුකම් ලත් පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.</u>

මූලික සුදුසුකම්

1. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුයි.
2. පැවරෙන කාර්යයන් අනුව දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය ඉටු කිරිමට හැකි කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු අතර පත් කරනු ලබන ඕනෑම ස්ථානයක රාජකාරි කිරිමට එකඟ විය යුතුයි.
3. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුයි.
4. බඳවා ගන්නා දිනට වයස අවුරුදු 22 ත් 45 ත් අතර විය යුතුයි. (රාජ්‍ය සේවයේ යෙදි සිටින අයවළුන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ)

**<u>උපදේශන නිලධාරී (පුනරුත්ථාපන) - ස්ථිර පදනම/ කොන්ත්‍රාත් පදනම.</u>**

බාහිර අයදුම්කරුවන් - උපදේශන මනෝ විද්‍යාව/මනෝ විද්‍යාව/සමාජ විද්‍යාව/අපරාධ විද්‍යාව පිලිබඳව හෝ මෙම තනතුරට අදාල වන විෂය ක්ෂේත්‍රයකින් විශ්ව විද්‍යාල කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් - ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම හෝ උපදේශන සහකාර (පුනරුත්ථාන) (MA 2-2) සේවා ශ්‍රේණියෙහි තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයෙහි තනතුරක අවම වශයෙන් වසර අටක (08) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

ස්ථිර වැටුප් පරිමාණය - MA 4 2025 - රු. 64,320.00 - 10×1360 - 15×1670 – 5×2040 – 113,170.00
කොන්ත්‍රාත් වැටුප - රු.76,398.00

**<u>උපදේශන සහකාර (පුනරුත්ථාපන) - ස්ථිර පදනම/ කොන්ත්‍රාත් පදනම.</u>**

බාහිර අයදුම්කරුවන් - තනතුරෙහි කාර්යභාරයට අදාලව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිලිගන්නා ලද වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) වැනි මට්ටමට නොඅඩු මට්ටමකින් පහත දැක්වෙන ක්ෂේත්‍රයකින් ප්‍රවීණතා සහතිකයක් ලබා ගැනීම. (අවම වශයෙන් එක් ක්ෂේත්‍රයකින් ප්‍රවීණතා සහතිකයක් ලබා තිබිය යුතු වේ)

උපදේශනය
මනෝ විද්‍යාව
සමාජ විද්‍යාව
මත්ද්‍රව්‍ය දුර්භාවිත කළමණාකරණය

අභ්‍යන්තර අයදුම්කරුවන් - ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් අදාල වේ.

ස්ථිර වැටුප් පරිමාණය - MA 2-2 2025 - රු. 50,540 10×540 - 7×630 – 4×1080 - 20× 1280 – 90,270.00
කොන්ත්‍රාත් වැටුප - රු.64,760.00

ඉහත සඳහන් වෘත්තීන් සඳහා සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයවළුන්ගේ අයදුම්පත් දක්වා ඇති සහතික පත් වල සහතික කළ ඡායාස්ථ පිටපත් සමඟින් පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 2025.12.01 දිනට ප්‍රථම ලැබෙන සේ යොමු කළ යුතුයි. ලියුම් කවරයේ වම් පස ඉහල කෙලවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කල යුතු වේ. බඳවා ගැනීම් සිදු කිරීමේදී ජන අනුපාතය අනුව බඳවා ගැනීම් සලකා බැලේ.

(අ) උප්පැන්න සහතිකය (ආ) අධ්‍යාපන සහතික (ඇ) ජාතික හැඳුනුම්පත

(ඈ) ග්‍රාම සේවා සහතිකය (ඉ) මාස 03 ක් ඇතුලත ලබා ගත් චරිත සහතික 02

(ඊ) ක්‍රීඩා සහ අනෙකුත් කුසලතා සහතික (උ) වෙනත් සහතිකපත්

මේ පිළිබඳ වැඩි විස්තර සඳහා 0112883891 අංකයට ඇමතීමෙන් ලබාගත හැකි අතර නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් ක්‍රියා කරනු නොලැබේ.

අයදුම්පත භාගත කර ගැනීමට සහ තැපැල් මාර්ගයෙන් යොමු කිරීම සඳහා.

පුනරුත්ථාපන කාර්යාංශය,
අංක **462/2,** කඩුවෙල පාර
**ගනහේන, බත්තරමුල්ල.**

දු.අං 011 - 2883891
විද්‍යුත් තැපැල් ලිපිනය bcg.rehabilitation@gmail.com